# ජනශ්‍රැතිය හා සන්නිවේදනය

අසිත මල්ලවආරච්චි *

සාරාංශය

ජනසන්නිවේදන විෂය අධ්‍යයනය කරනු ලබන විද්‍යාර්ථීන් සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස හඳාරනු ලබන ජනශ්‍රැතිය යන්න අද බෙහෙවින් භාවිත වන අතිශය ජනප්‍රිය වදනකි. එහෙත් එය ගැඹුරු අර්ථයක් දනවන පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන වස්තු විෂයයක් බව බොහෝ දෙනා විසින් අවබෝධ කොට ගෙන නොමැත. මේ හේතුව නිසාම විවිධ පාර්ශවයන්ගේ අවධානය මෙම ජනශ්‍රැතිය කෙරෙහි යොමු වී ඇති අතර එම ජනශ්‍රැතිය ශාස්ත්‍රීය ලෝකයේ මහත් පිළිගැනීමකට ලක් වූ ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ලෙස සම්මානයට පාත්‍රව ඇත. ඒ තුළින් සමස්ත ප්‍රජාවගේ අවධානය මෙම ක්ෂේත්‍රයට යොමු වනු ඇත. එවිට සෑම සමාජයකම සංස්කෘතික උරුමයක් ලෙස සැලකෙන තම තමන්ගේ ජනශ්‍රැති ආරක්ෂා කිරීමට මෙන්ම, අධ්‍යයනය කිරීම සඳහාද පෙළඹෙනු ඇත. එහෙයින් එකී අවබෝධය පොදු ජනතාවටද ලබා දීම සඳහා ජනශ්‍රැති විෂය සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කරනු ලැබේ. සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යවලට පවතින අභියෝගයන් සමඟ අදාල සංදේශය තීව්‍රව ජනතා ගත වීම පිණිස ජනශ්‍රැතියේ පවතින්නාවූ වැදගත්කම මෙහිදී ප්‍රධාන කොට අධ්‍යයනය කරනු ලැබේ. විශේෂයෙන්ම ජනශ්‍රැති අංගෝපාංග ජනශ්‍රැති ක්‍රියාදාමය මෙන්ම ජනශ්‍රැති චින්තනය තුළින් අදාල සන්නිවේදන කාර්යය සිදු කරන ආකාරය මෙහිදී පරීක්ෂා කළ හැක. ජනශ්‍රැති තුළින් සිදුවන්නාවූ සන්නිවේදන කාර්යය මෙන්ම ජනශ්‍රැතිය යන පොදු නාමයෙන් හැඳින්වෙන ප්‍රකාශන මාධ්‍යයේ වපසරිය අධ්‍යයනය කිරීමද මෙහිදී අරමුණු කරනු ලැබේ. පරම්පරාවෙන් තවත් පරම්පරාවකට සන්නිවේදනය කටයුතු තොරතුරු, පණිවුඩ, හැඟීම්, දැනුම් සියල්ලම කවි, කථා, ගී, තේරවිලි, ප්‍රවාද ලෙස ප්‍රභේද වී ඇති ආකාරයද අධ්‍යයනය කරනු ලැබේ.

## හැඳින්වීම

බටහිර යුරෝපය ආශ්‍රිතව සිදු වූ කාර්මික විප්ලවයෙන් පසුව ලෝක සමාජය තුළ සිදු වූ ප්‍රබලම වෙනස්වීම වන්නේ නවීන සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි. මෙම සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමගම සමස්ත ලෝකයේ සෑම ජන සමාජයක්ම ඉතා සංකීර්ණත්වයට පත්ව ඇත. එමෙන්ම මෙම නවීන සමාජ, තොරතුරු මත යැපෙමින් සිටී. මෙම සංකීර්ණ ක්‍රියාවලිය තුළ ලෝකයේ නැවත ජනමාධ්‍ය බිහිවීමක් සිදු වන්නේ නැත. ජනමාධ්‍ය නොමැති කමේ හිස් අවකාශය පිරවීමට නව මාධ්‍යය ලෝකය තුළ බිහිවෙමින් පවතී. මානව සන්නිවේදන වංශ කථාවේ මෙම ඉදිරි පියවරට මුල් ගල තබන්නේ ජොහැනස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයාගැනීමත් සමඟය. ඒ නව සමාජයේ තොරතුරු බෙදා හැරීම් පිණිස මුද්‍රිත මාධ්‍ය ඔස්සේ බිහි වූ පුවත්පත, සඟරාව, වාර ප්‍රකාශන, පෝස්ටර් ආදියේ සිට ගුවන්විදුලිය, රූපවාහිනිය, සහ සිනමාව අතික්‍රමණය කර ඇත. එහි අවසන් ඵලය වී ඇත්තේ සයිබර් අවකාශයේ සිට තොරතුරු ජාල

* තාවකාලික කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය / asithaprabhath@ymail.com

සමග ගනුදෙණු කිරීමට මානවයා පුරුදු පුහුණු විමයි. ඒ අනුව මිනිසා සංස්කෘතිමය වශයෙන් බන්ධනය කළ භූගෝලීය සාධක තව දුරටත් සන්නිවේදනය සීමා කිරීමට වලංගු නොවේ.

## සාම්ප්‍රදායික සන්නිවේදනය

ලෝකය අවබෝධ කර ගැනීමට මානව වර්ගයා ප්‍රයෝජනයට ගනුලබන්නේ මෙකී ජන මාධ්‍ය හා නව මාධ්‍ය පමණක්ම නොවේ. මෙම නවීන සන්නිවේදන මාධ්‍යයෝ බිහි වීමට පෙර සිටද මානව අවශ්‍යතා සම්පූර්ණ කරනු වස් පුද්ගලයා සන්නිවේදන ක්‍රමවේදයන් ප්‍රයෝජනයට ගත්තේය. එම සන්නිවේදන ක්‍රමවේදයන් සාම්ප්‍රදායික සමාජය තුළ ම උපත ලැබූ, එම සාම්ප්‍රදායික සමාජය තුළම ක්‍රියාත්මක වී, සාම්පදායික මානවයා සමගම ගනුදෙනු කර ඇති මෙම මාධ්‍ය සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍ය ලෙස හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ සෑම රටකම ඒ ඒ රටට ආවේණික වූ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයන්ට පදනම සකසනු ලබන්නේ ප්‍රාථමික සන්නිවේදන ක්‍රමවේදයන්ය. මානව පරිණාමයේ පූර්ව අවධියට ගමන් කළ විට මෙම ප්‍රාථමික සන්නිවේදනය පිළිබඳව අධ්‍යනය කළ
හැක. සාම්ප්‍රදායික සන්නිවේදනය traditional communication ලෙස හඳුන්වන අතර ප්‍රාථමික සන්නිවේදනය primitive communication ලෙස හඳුන්වනු ලැබේ. ආදි ගෝත්‍රික සමාජය තුළ ප්‍රාථමික මානවයා අනුගමනය කළ සන්නිවේදන ක්‍රමෝපායන් ප්‍රාථමික සන්නිවේදන ක්‍රමෝපායන් ලෙස සාකච්ඡා කෙරෙන අතර එම ප්‍රාථමික තත්වයෙන් මිදුණ සාම්ප්‍රදායික සමාජවල ක්‍රියාත්මක වූ සන්නිවේදන ක්‍රමෝපායන් සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ.

ගස්, ගල්, පර්වත ඇසුරු කරමින් වනාන්තර මධ්‍යයේ ජීවත් වූ ආදිවාසී මානවයා එම පරිසරයම භුක්ති විඳිමන් ජීවත් වූහ. වනාන්තර, ලැහැබවල ඇවිදගිය මිනිසා සතුන් දඩයම් කරමින්, මරා ගින්නෙන් පුලුස්සාගෙන, ආහාර සකස් කොට ගෙන බෙදා හදාගෙන ජීවත් වූවෝය. වනාන්තරය තුළම හටගන්නා එල බුදිමින් අල හාරා තම්බා ගැනීමෙන් මූලික ආහාර අවශ්‍යතාවය සපුරා ගත්තෝය. මෙම දෛනික දිවි පැවැත්මට අනුකූලව ගතකරන සමයේදී මානවයා හා ස්භාවදහමේ පවතින අපූර්ව සබැඳියාවේ එලයක් ලෙස ඇදහීමේ වත්පිළිවෙත් හා යාතුකර්ම සඳහා අවතීර්ණ වේ. ඉර, හඳ, ගස්, ගල් , මහපොළව ආදියට කැගසා සොබා දහමේ විවිධ ශබ්දවලට අනුකූල වෙමින්, සත්ව හඬවල් අනුකරණය කරමින් අන්නෝන්‍ය වශයෙන් සන්නිවේනය සිදු කළෝය. කෑ ගැසීම, හූ කීමට අමතරව, කොළ අතු එකතුකොට ගිනි තබා දුම් අහසට නැංවීම වැනි නිර්වාචික සන්නිවේදන ක්‍රම ඊට පදනම සකස් කළේය. පසුකාලයේදී ස්භාදහම තුළින්ම සොයාගත් විවිධ මෙවලම් උපයෝගි කරගනිමින් යම් යම් පණිවිඩ සන්නිවේදනය කර ගත්තේය.

මානව සන්නිවේදන ඉතිහාසයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති මෙම ප්‍රාථමික සන්නිවේදන ක්‍රම ප්‍රධාන කොටස් 2කට බෙදා දැක්විය හැක.

I. දෘශ්‍ය සංඥා (Visual Signals)
II. ශබ්ද සංඥා (Sound Signals)

ප්‍රංශයේ ලැස්කෝ, ස්පාඤ්ඤයේ ඇල්ටමීරා, ගල් ගුහා තුළ ඇඳි චිත්‍ර දෘශ්‍ය සංඥා ලෙස වර්තමානයේදී

අධ්‍යයනය කරන අතර මානව සන්තායන තුළ ගොඩ නැගුණ අදහස් උදහස් ආකල්ප හා විවිධ භාව ප්‍රකාශයන් ආදි රේඛා සටහන් මඟින් සන්නිවේදනය කොට ඇත. අදහස් සන්නිවේදනයෙහිලා මෙම චිත්‍රවලට අක්ෂරමය වටිනාකමක් ලැබුණ හෙයින් පසු කාලයේදී එම රූප, චිත්‍රාක්ෂර හා රූපාක්ෂර බවට පරිවර්තනය විය. සංකේත යනු සරල ලෙස අදහස්, හැඟීම්, විවිධ ප්‍රස්තුත හා අවස්ථාවන් නියෝජනය කරන ශබ්ද හෝ රූප විශේෂයක් ලෙස පිළිගතහොත් මුළු මහත් මානව සංහතියේම සන්නිවේදන ක්‍රියාවලිය සිදුවන්නේ මෙම සංකේත පදනම් කරගෙන බව වටහා ගත හැකිය. මෙලෙස බිහිවන්නාවූ ශබ්දය හා අර්ථය අතර ඇති සම්බන්ධතාවය ඉතා සරලව භාෂාව ලෙස නිර්වචනය කිරීමට පුලුවන.

ගස්, ගල් වන්දනා කරමින්, සතුන් දඩයම් කරමින් වනාන්තර මධ්‍යයේ ගෝත්‍රික වශයෙන් ජීවත් වූ ආදි මානවයෝ ගංගා නිම්න දක්වා සංක්‍රමණය වූහ. ඒ අනුව දඩයම් කිරීම අතහැර කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය තුළින් සිය ජිවිකාව රැගෙන ගිය අතර ඒ ඔස්සේ සංවිධානය වීමට පෙළඹුණි. ඒ අනුව එම සංවිධාන ජාලය තුළ අන්තෝන්‍ය වශයෙන් පණිවුඩ හුවමාරු කිරීමට භාවිතා කළ නිර්වාචික සන්නිවේදන ක්‍රම පසෙක තබා සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේදයන් කරා එළඹුණි. සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍ය වශයෙන් අපට ඉතා පැහැදිලිව හඳුනා ගත හැක්කේ සාම්ප්‍රදායික සමාජවල, සාම්ප්‍රදායික ඥාණය භාවිතා කරමින් සකස් කරගනු ලැබූ සන්නිවේදන උපක්‍රමයන්ය. මෙම සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම භාවිතා කරන ගැමි ජනතාවගේ ජිවන වෘත්තීන් මෙන්ම ඔවුන්ගේ සිතුම් පැතුම් සමඟමද අවියෝජනීය ලෙස බැඳී පවතී.

## ජනශ්‍රැතිය යනු

ශ්‍රී ලාංකික ජන සමාජය තුළ හුව, අඬහැරය, ජන කවිය, ජන ක්‍රීඩා, ගැමි ශාන්තිකර්ම, ගැමි නාටක, දුම් ගැසීම, කවි කොළය, විරුදුව, රූකඩ, පිංකම්, ධර්මදේශනා, ආප්තෝපදේශ, ප්‍රස්ථාපිරුළු, ජන නැටුම්, බලිතොවිලි ආදී ගැමි මාධ්‍යයන් විශාල ප්‍රමාණයක් හඳුනා ගත හැකිය. මෙම ජන සංස්කෘතික උරුමයන් පිළිබඳව වෙන වෙනම අධ්‍යයනය කිරීමෙන් සාම්ප්‍රදායික සන්නිවේදන කාර්යය තුළ ජනශ්‍රැතියට පවතින්නාවූ සුවිශේෂත්වය හොඳින් අවධාරණය කළ හැක.

"ජනශ්‍රැති" යන්න පැහැදිලිව අර්ථ දැක්වීමට පෙර එය "ජන" හා "ශ්‍රැති" යනුවෙන් විභේදනය කළ හැක. "ජන" යන්න ජන සමූහයක් හෙවත් ජන කොට්ඨාශයක් ලෙස දැක්විය හැක. "ශ්‍රැති" යන්නෙන් අදහස් කරන්නේ අසන දේය. එනම් ජනතාව මුඛ පරම්පරාවෙන් පැවත ගෙන එන දේය. ඒ අනුව ජනශ්‍රැති යන්න ඉතා සරලව ජනතාව විසින්, ජනතාව පිළිබඳව, ජනතාව මඟින් අසනු ලබන දේ යැයි අර්ථ දැක්විය හැක. මහාචාර්ය ජේ.බී. දිසානායක විසින් ජනශ්‍රැති ශබ්දකෝෂයේ දක්වා ඇත්තේ "ජනශ්‍රැති" යන පදය කිසියම් ජන කොට්ඨාශයක් අතර මුඛ පරම්පරාගතව එන ව්‍යාවහාර සමුච්චයක් ලෙසය. ඒ අනුව අපට ජනශ්‍රැතිය යනු ජන දැනුම් සම්භාරයයි.

## ජනශ්‍රැතිය පිළිබඳ නිර්වචන

"ජනශ්‍රැති යනු වාචිකව හෝ සිරිත් විරිත් මඟින් සම්ප්‍රදායෙන් උරුමකර ගනු ලැබූ දෙයකි. වාචිකව එන ජන කථා, ජන ගී, ආප්තෝපදේශ, තේරවිලි ආදිය විය හැකිය. එය අවි ආයුධ ආදී සම්ප්‍රදායානුකූලව එන භෞතික දේවල් විය හැකිය. සම්ප්‍රදායික චර්යා විය හැකිය. එය සාම්ප්‍රදායික ඇදහිලි විය හැකිය."

- ඇමරිකන් ජාතික ඒ. ටේලර් -

"ජනශ්‍රැති යනු වාචික කලා හෝ ද්‍රව්‍යමය ස්වරූපයෙන් ප්‍රකාශනය කරනු ලබන මිනිසුන්ගේ නිර්මාණශිලි අදහස්වල ප්‍රතිඵලයකි."

- ඉන්දීය ජාතික මෂාරුල් ඉස්ලාම් -

ජනශ්‍රැතිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනිමට නම් ඊට ඇතුළත් වන්නාවූ විෂය පරාසය පිළිබඳව මූලිකවම දැනුවත් විය යුතුය. ඊට අයත් දෑ අතර භාෂාව, සාහිත්‍ය, සංගීතය, නැටුම්, ක්‍රීඩා, දේව ඇදහිලි, වත්පිළිවෙත්, චාරිත්‍ර, අත්කම්, නිර්මාණ හා වෙනත් කාලාවන් ඇතුළත් වේ. එමෙන්ම මිනිසුන්ගේ ගති පැවතුම්, සිරිත්විරිත්, චර්යාධර්ම, මිත්‍යාවිශ්වාස, කටකථා, ප්‍රස්ථාවපිරුළු ආදියද ඇතුළත් කළ හැක. මෙම සියල්ලම ජනශ්‍රැතිය තුළ එන සංක්ෂිප්ත විෂය ක්ෂේත්‍රය ලෙස දැක්වුවහොත් ඒ ඒ එක් එක් විෂයට ඇතුළත් අනු විෂයයන් ගණනාවක් ද පවති.

ජන සාහිත්‍ය තුළ ජන කථා, ජන ගී, ජන කවි, ජනප්‍රවාද, ජනවහර, තේරවිලි, ප්‍රහේලිකා ආදියද දැක්විය හැකිය. එමෙන්ම එම අනුවිෂයයන් තවත් සුළු විෂය පථයන්වලට විහිදියන ආකාරය පැහැදිලිව දැකිය හැක. ජන කථාවේ පවතින්නාවූ අංග අතර ඓතිහාසික කතා, පරම්පරා කථා, වීර කථා, ස්ථාන පිළිබඳ කථා, පුද්ගලයන් පිළිබඳ කථා, සිද්ධීන් පිළිබඳ කථා, වෘත්තීන් ආශ්‍රිත කරගත් කථා, අද්භූත කථා ආදි වශයෙන් උප ප්‍රභේද ගණනාවක් දැක්විය හැක. ජන කවි තුළ නෙළුම් කවි, පැල් කවි, ගොයම් කවි, කමත් කවි, දරු නැළවිලි, පාරු, පතල්, කරත්ත, පෙම්කවි, විරහ කවි, බඹර කැඩීමේ කවි, උපදේශනාත්මක කවි ආදි දැනුම් සම්භාරයක්ම ජනශ්‍රැති විෂය පථයට ඇතුළත් වේ.

දෛනික ජිවිතයේදී පිළිපදින ක්‍රියාකාරකම් අලලා, සිදු කෙරෙන්නාවූ චාරිත්‍රවාරිත්‍ර, සිරිත්විරිත්, ගති පැවතුම් සියල්ලම ජනශ්‍රැතියේ වැදගත් කොටසක් වේ. උපතේදී රංකිරි කටගෑම, අකුරු කියවීම, කොටහළුව, විවාහය, ගැබ් පෙරහැර, කිරිදානය ආදී සියලු චාරිත්‍රවාරිත්‍ර මෙන්ම ඇදහිලි, විශ්වාස, අවවාද, කවිකථා, ගී, කෙම් ආදි සියල්ල ජනශ්‍රැතිවල වැදගත්කම තව තවත් තහවුරු කර ඇත. අනෙක් අතට නොපෙනෙන බලයන්, අද්භූත ශක්තීන් පාදක කොටගත් දේව ඇදහිලි හා මිථ්‍යා විශ්වාස පද්ධතිය ප්‍රධාන අංගයෝ වේ. එම අභිචාර එක් අතකින් ජනශ්‍රැති කරාද තවත් අතකින් සාම්ප්‍රදායික සන්නිවේදනයටද ඉමහත් සේවයක් සපයනු ලැබේ. ලෙඩදුක්, කරදර, නියං, ගංවතුර, විපත් ආදී අවස්ථාවල දුකට පත් ජනතාව එයින් මිදීමට මෙම ඇදහිලි හා විශ්වාස මත යැපෙමින් සිය හිත පිරිසිදු කර ගත්හ. ගම්මඩු, පහන්මඩු, දෙවොල් මඩු ආදී වශයෙන් ශාන්තිකර්ම බිහිවන්නේ මෙම ජනශ්‍රැතිය පෝෂණය කරමින්ය.

සමාජයේ ජනතාවගේ දෛනික රැකියා, ජීවනෝපායන්, විවේක අවස්ථාවන්, ගමන්බිමන් ආදී සෑම අවස්ථාවක්ම පාධක කරගෙන ජනශ්‍රැති විශාල සංඛ්‍යාවක් බිහිවී ඇත. ගොවිතැන් මුල් කොටගත් ආර්ථික රටාවකට හැඩ ගැසුණු ශ්‍රී ලංකාව වැනි සමාජයකට ඊට අදාල දැනුම් සම්භාරය පරම්පරාවෙන් පරම්පරාවට පවත්වාගෙන පැමිණ ඇත. බෝග සංරක්ෂණය, ගොවිපළ රැකීම, එහිදී මුහුණ පාන්නට වන දුක්ඛ, දෝමනසයන් මෙම ජනශ්‍රැති ඔස්සේ විදහා දක්වනු ලැබේ. එපමණක් ද නොව දේශීය වෙදකම, විනෝදය, ජන සෙල්ලම් පිළිබඳව ද ජනශ්‍රැතිය පෝෂණය වී ඇත. විශේෂයෙන්ම දේශීය වෙදකම පරම්පරාවට පැවත ගෙන ආ ශාස්ත්‍රයකි. එමෙන්ම එම දැනුම් සම්භාරය සතුවූ උගැන්වීමෙන් ගෙන ආවා පමණක් නොව තේරවිලි, ප්‍රහේලිකා, ගැටළු වශයෙන්ද සන්නිවේදනය වීම තුළින් ජනශ්‍රැති විෂයයට නව විෂය සම්භාරයක් එකතු වී ඇත. අනෙක් අතට හෙළයේ ජන කෙලි සෙල්ලම් අතර නැටුම්, ගැයුම්, කථා, ගී

ආදියෙන් ස්වයංපෝෂිත වී ඇත. ඔන්චිලි වාරම්, කළගෙඩි කෙළිය, ලී කෙළිය, එළුවන් කෑම, ඔළිඳ කෙළිය, අං කෙළිය, පොර පොල් ගැසීම ආදිය එහිදී වැදගත් තැනක් ලබා ගනී.

ජනශ්‍රැති අතර විනෝදය, සෞන්දර්ය රසවිඳීම, පමණක් නොව, දුක වේදනාව, කාංසිය කියාපාන අස්ථාවන්ද බොහෝය. සමාජයේ සියලු දෙනාටම දුක, වේදනාව, යනාදි චෛතසිකයන් විවිධ හේතූන් මත හට ගනු ලැබේ. එම දර්ශනය ජනශ්‍රැති අංග ඔස්සේ ප්‍රකාශ කිරීමෙන් අදාල මනෝභාවයන් තුලනය කර ගැනීමට වෙර දරා ඇති ආකාරය මින් මොනවට පැහැදිලි වේ.

අනෙක් අතට පෞඪ ඉතිහාසයකට උරුම කම් කියන ශ්‍රී ලාංකික ජාතියක් ලෙස අපට ලැබී ඇති ජන උරුමයන් පිළිබඳව විග්‍රහ කිරීම මෙහිදී ඉතා වටී.

පැරැණ්නන් විසින් නිර්මාණය කරන ලද වැව්, අමුණු, ඇළමං මෙන්ම වෙහෙර, විහාර, ස්තූප, ලෙන්, වාසල් ආදියද මෙහිදී ප්‍රධාන කොට සැලකිය හැක. එපමණකුදු නොවේ, කෘෂිකර්මයෙහි භව භෝග ආරක්ෂණ ක්‍රම ලෙස යොදාගත් විවිධ ක්‍රම මෙන්ම කෙම් ක්‍රමද පාරිසරික තුලනයට හිතකර සාධකයක් විය.

මේ ආකාරයට විමසා බලන විට ජනශ්‍රැති විෂය ක්ෂේත්‍රයට අයත් යැයි හඳුනාගත් සියලු විෂය ක්ෂේත්‍රයන් අවබෝධ කර ගැනීමේ පහසුව තකා ප්‍රධාන කොටස් 04 කට බෙදා දැක්විය හැක.

I. ජන සාහිත්‍යය
II. ජන පිළිවෙත්
III. ජන කලා
IV. ජන විද්‍යා හා තාක්‍ෂණ

ඊට අයත් වන්නාවූ අනුකොටස් ද පහත පරිදි දැක්විය හැක.

| | |
|---|---|
| ජන සාහිත්‍යය | ජන කථා, ජන කවි, ජන ගී, ගැටපද, තේරවිලි, ප්‍රහේලිකා, උපමා, ආදර්ශ පාඨ, ජන වහර, යන්ත්‍රමන්ත්‍ර, යැදීම්, උපදේශ, අවවාද, කුරුටු ගී, බිත්ති පාඨ, විහිළු තහළු, ලිංගික දෑ, උත්තර ප්‍රති උත්තර, ආචාර සමාචාර |
| ජන පිළිවෙත | - දෛනිකව සිදු කරන හා ඉදහිට හෝ වරින්වර සිදු කරන පිළිවෙත් ආදිය |
| ජන කලා | - රඟ දැක්වෙන කලා, නැටුම්, ගැයුම්, චිත්‍ර, මූර්ති, කැටයම්, රෙදිපිලි, ආභරණ ආදිය |
| ජන විද්‍යා හා තාක්‍ෂණය | - වෛද්‍ය විද්‍යා, සූප ශාස්ත්‍ර, ඉංජිනේරු විද්‍යා, වන විද්‍යා තාක්‍ෂණ, වාස්තු විද්‍යා, යකඩ කර්මාන්තය, ධීවර කර්මාන්තය, ප්‍රවාහන, මහාමාර්ග |

## සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයක් ලෙස ජනශ්‍රැතියේ පවතින සුවිශේෂතා

ජනශ්‍රැතිය නිර්වචනය කිරිමේදී එය ජනයා අතර ප්‍රචලිත යන්න ඊට අනන්‍යවූ ප්‍රධාන ලක්‍ෂණයක් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එය තුළ ජන ගුණය පවතී. එනම් ජනතාව පදනම් කොට ගෙන එය නිර්මාණය වීම, වර්ධනය වීම හා රඳා පැවතීමයි. අනෙක් අතට මෙය සතු සුවිශේෂත්වය වන්නේ ඇසීමේ ගුණයයි. පරම්පරාවෙන් පරම්පරාවට පැවත ගෙන ඒම හේතුකොටගෙන මෙම ජනශ්‍රැතිකාංග මුඛ පරම්පරාගතව රැඳි පවතී. අසා දැන ගැනීම විකාශන මාධ්‍ය කොටගත් පැරණි සමාජයේ කෙනෙකුගෙන් තව කෙනෙකුට, එක පරම්පාරවකින් තව පරම්පරාවකට වාචිකව සන්නිවේදනය කරන්නට ඇතැයි විවාදයක් නොමැත. ඉපැරණි සමාජයේ ආනුභූතිකව හෝ ප්‍රත්‍යක්‍ෂයෙන් ලබා ගන්නා ලද සියලු දැනුම් සම්භාරයන් ඊළඟ පරම්පරාව සඳහා උරුම වූයේ ඒවායේ ඔවුන් විසින් දකින ලද හරවත් බව, බලවත් බව හා ජීවිතයට අදාළත්වය අවබෝධ කොට ගෙන මතු පරම්පරාවේ අයටද ඵල ප්‍රයෝජන ගැනීම උදෙසාය.

ජනශ්‍රැති සතු තවත් විශේෂ ලක්‍ෂණයක් වන්නේ ඒවායේ පවතින පෞරාණික බවයි. ඒ අනුව ජනශ්‍රැතිය යනු හැමවිටම අතීතයට අයත් පැරණි අංගයකි. ජනශ්‍රැති වශයෙන් අද අප හඳුනාගෙන ඇති කිසිදු වස්තු විෂයක ආරම්භය කවදා, කෙසේ, කොතැනක සිදු වුණාදැයි ස්ථිරවම ප්‍රකාශ කළ නොහැක. නමුත් මෙම සෑම වස්තු විෂයක් පිළිබඳවම ගැඹුරුව අධ්‍යයනය කිරිමෙන් ඓතිහාසික, සාමාජීය තොරතුරු, අනන්ත ප්‍රමාණයක් සොයා ගැනිමට හැකියාව ලැබී ඇත.

ජනශ්‍රැතිවලට අනන්‍යතාවය ලබා දෙන තවත් ගුණාංගයක් වන්නේ අඥාත කර්තෘත්වයි. වර්තමානයේ අප විසින් ජනශ්‍රැති ලෙස සලකනු ලබන කිසිදු නිර්මාණයකට කර්තෘවරයෙක් සොයා ගත නොහැක. කාලාන්තරයක් තිස්සේ මුඛ පරම්පරාගතව පැවතගෙන එන මෙම ජනශ්‍රැති වල ආකෘතිය හා අන්තර්ගත හරය පිළිබඳ අවධානය යොමු කළා මිස කර්තෘත්වය පිළිබඳව මතකයක් තබා ගෙන නොමැත. එමෙන්ම මෙම ජනශ්‍රැතිය තුළින් සමාජයේ පොදු අපේක්ෂාවන් පිළිඹිමු වී නියෝජනය වූ බැවින් පෞද්ගලික කර්තෘත්වය ඉවත් වී පොදු ගුණය ඉස්මතු වී ඇත. එසේ නොවන දෑ සමාජ සම්මතයට හසු නොවන බැවින් වහාම අහෝසි වී යයි.

ජනශ්‍රැතිවල තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ එහි පවතින සන්නිවේදන කාර්යයයි. අප ජනශ්‍රැති හඳුන්වනු ලබන්නේ සන්නිවේදන මාධ්‍යයක් හෙවත් ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන්ය. පරම්පරාවෙන් පරම්පරාවට, සමාජ ක්‍රමයෙන් සමාජ ක්‍රමයට, පන්තියෙන් පන්තියට සන්නිවේදනය කළයුතු තොරතුරු, පණිවුඩ, හැඟිම්, දැනුම් සියල්ල විදහා දක්වනු ලැබේ. ඒවා කවි, කථා, ගී, තේරවිලි, ප්‍රවාද ආදි නම්වලින් හඳුන්වනු ලබන අතර ඒ තුළ සුවිශාල සන්නිවේදන කාර්යය භාරයක් ඇතැයි නිගමනය කළ හැක. මේ හේතුව නිසා ජනශ්‍රැතිය යන්න ප්‍රබල සමාජානුයෝජන කාරකයක් ලෙස සැලකිය හැක. කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයට අයත් නොයෙක් ආකාරයේ නොයෙක් ජනශ්‍රැති අධ්‍යයනය කිරිමේදි සාර්ථක ලෙස ගොවිතැන් කරගෙන යාමට අවශ්‍ය මූලික දැනුම් සම්භාරය නොසඟවා පවසනු ලැබේ. කල්යල් බලා ගොවිතැන් ආරම්භ කරන අයුරු අනුපිළිවෙලකට ගොවි චක්‍රයේ විවිධ කාර්යයන් ඉටු කරන අන්දම, භෝග ආරක්ෂණ ක්‍රමවේද, අස්වැන්න බෙදා හදා ගැනිමේ සම්මත ක්‍රම, අරපිරිමැස්මෙන් භුක්ති විඳිම, කෘත ගුණ දැක්වීම ආදි සකල විධ ක්‍රියාදාමය මේ තුළ අන්තර්ගත වේ. උපදේශ කාව්‍ය, වීර කාව්‍ය, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු, ආදි ජනශ්‍රැති ඔස්සේ සමාජයේ යහපැවැත්මට අවශ්‍ය වු ගුණ ධර්ම, සාරධර්ම, පිළිවෙත් කියා දෙනු ලබයි.

එමගින් සදාචාර සම්පන්න ගෞරවනීය සමාජයක් බිහිකිරීමට එදා සමාජය දරණ ලද ප්‍රයත්නය ජනශ්‍රැති තුළ ප්‍රකාශිත වේ.

ජනශ්‍රැති බිහිවන්නේ ජන සමාජය තුළින් බැවින් එකී ජන සමාජයේ විවිධ පැතිකඩවල් මෙන්ම විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විවිධ අත්දැකීම් පිළිබඳ තොරතුරු කියා පානු ලැබේ. ජනකතා තුළින් බෝහෝ විට ප්‍රකාශ වන්නේ එකල සමාජයේ සිදු වූ සිදුවීම්ය. අනෙක් අතට ජනශ්‍රැති සෑම එකකින්ම ප්‍රකාශය කරන්නේ හුදෙක් එක් පුද්ගලයෙකුගේ හැඟීමක්, අදහසක්, විශ්වාසයක් නොව පොදුවේ සමස්ත සමාජයේම හැඟීම්ය. අදහස්ය, වේදනාවන්ය, එවිට ඒවා සියලු දෙනාගේම පිළිගැනීමට පත්වීම හේතුවෙන් සියලු දෙනා විසින්ම වැළඳ ගැනීම නිසා නොමැකී පවත්වාගෙන ඒමට රුකුල් දී ඇත.

අනෙක් අතට මානව වංශ කතාවේ ඉම පුළුල් කිරීම සඳහා අන්තර් සංස්කෘතික අධ්‍යයනය තුළින් විවිධ රටවල සංස්කෘතික ජාතික උරුමයන් හඳුනා ගැනීමට ජනශ්‍රැතිය තුළින් හැකියාව ලැබේ. ජපන් සෙන් කතා තුළින් අතීත ජපානයේ සමාජ තත්ත්වය අධ්‍යයනය කිරීමට පුළුවන. අනෙක් අතට මෙම අන්තර් සංස්කෘතික ලක්ෂණ එක් කොට නව නිර්මාණ බිහි කිරීමට ද අවස්ථාව උදා වී ඇත. මනමේ නාට්‍ය බිහිවීමට මනමේ කෝළම හා ජාතක පොතේ චුල්ල ධනුද්ධර ජාතකය පදනම් වීම නිදසුන් කොට දැක්විය හැක.

## නිගමනය

සාම්ප්‍රදායික ජන සමාජයේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා බිහි වූ ජනකතා, ජනකවි, ජනක්‍රීඩා, ජන ඇදහිලි, ජන විශ්වාස, ජන ආගම්, ආප්තෝපදේශ, ප්‍රස්ථා පිරුළු, පුරාවෘත්ත, ජන නාට්‍ය, ජන නැටුම් යනාදිය අධ්‍යයනය කිරීමට වෙන් වූ විෂය ක්ෂේත්‍රය වන ජනශ්‍රැතියට සාම්ප්‍රදායික සන්නිවේදන ක්ෂේත්‍රය තුළ සුවිශේෂිත වූ සම්ප්‍රදායන් දක්නට ලැබෙන අතර ඒ ඒ ජන කණ්ඩායම් වල සදාචාරයට සංස්කෘතිකයට, සමාජ ක්‍රියාකාරිත්වයට පාදක වූ සමාජ සාධකයන් අපට ජනශ්‍රැතිය ඔස්සේ හඳුනා ගත හැකි බව පැහැදිලි වේ. සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ ජනශ්‍රැතිය පිළිබඳව නියමාකාරයෙන් අධ්‍යයනය කිරීමට නම් විශේෂ ක්‍රම පද්ධතියක් ඔස්සේ එය විද්‍යාත්මකව හැදෑරිය යුතුය. මෙහිදී සමාජ විද්‍යාත්මක හා සන්නිවේදන විද්‍යාත්මක දෘෂ්ටි කෝණ ඔස්සේ විමසා බැලීම වැදගත් බව අනාවරණය විය. ජනශ්‍රැති විද්‍යාත්මකව හැදෑරීම තුළ ඒ ඒ රටවල සංස්කෘතීන් පිළිබඳවත් ගැඹුරින් අධ්‍යයනය කිරීමට අවකාශය උදා වේ. මේ අනුව සමස්ත පැහැදිලි කිරීම තුළ අපට නිගමනය කළ හැක්කේ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේදයක් ලෙස සැලකෙන ජනශ්‍රැතියේ අවසාන ඵලය එක් පසෙකින් සෞන්දර්යාත්මක සන්නිවේදනයක් වන අතර අනෙක් පසින් ආඛ්‍යානය හා සම්ප්‍රදායන් ප්‍රගුණ කරවන වාචික හෝ ලිඛිත භාෂාමය සන්නිවේදනයක් බවයි.

## ආශ්‍රෙය ග්‍රන්ථ මාලාව


- කුලරත්න, සාලිය, (2006), සන්නිවේදන හා ජනශ්‍රැතිය, රත්නායක ප්‍රින්ටර්ස්, නිට්ටඹුව.
- ස්වර්ණසිංහ, කේ. එම්. අයි. (2006), සංවර්ධන සන්නිවේදනය හා සොකරි, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

- රාජපක්ෂ, චන්ද්‍රසිරි, (2005) මාධ්‍ය විමර්ශී 04, ICS ක්‍රියේෂන්, මාකොළ
- පියදාස, රෝහණ, ලක්ෂ්මන් (2006) සන්නිවේදන විමර්ශන, මාධ්‍ය හා සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය
- දිසානායක, විමල්, (2009) සංවර්ධනය හා සන්නිවේදනය, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10
- කොමර්ෂල් බැංකුව (2003) හෙළ මඟ විසිතුරු
- රත්නපාල, නන්දසේන (2007) ජනශ්‍රැති විද්‍යාව, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10
- වීරසේකර, තිස්ස (1997) සිංහල ජනශ්‍රැති වලින් නිරූපිත අපේ සංස්කෘතිය , ගුණසේන සහ සමාගම, කොළඹ 11
- https://en.wikipedia.org/wiki/Folklore